# පුරප්පාඩු දැන්වීමයි

## සී/ස උඩිස්පත්තුව විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී 1 තනතුර සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

| | | | |
|---|---|---|---|
| 01. | තනතුරු නාමය | - | සාමාන්‍යාධිකාරී 1 |
| 02. | තනතුරු සංඛ්‍යාව | - | 01 |
| 03. | වයස් සීමාව | - | 18 – 50 (දැනටමත් සමුපකාර සේවයේ ස්ථිර අයවලුන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.) |
| 04. | වැ. පරිමාණ අං. | - | H.L01.01 |
| 05. | වැ. පරිමාණය | - | 36,000-720X10-1,080X10-1,440X10=68,400.00<br>(මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනාවන් ගෙවනු ලබන අතර, සේවක විශ්‍රාම වැටුප, සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ඔබ දායක කරනු ලැබේ.) |

06. සුදුසුකම් -

අ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 11 ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් /සහකාර සාමන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ආ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම.(රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය/ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) / උසස් තාක්ෂණ ආයතනයේ වසර 2 1/2 ක කාලයක් සඳහා වූ ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය/ මානව සම්පත් කළමනාකරණය යන විෂයන්ගෙන් යුතු පාඨමාලාවක් සමත් වී තිබීම

**හෝ**

ඇ. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය / පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදළ විෂයන් ඇතුළත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම/ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදළ මාස 09 කට නොවූ අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාව සමත්වීම.

07. අයදුම්පත් ඉදිරිපත් කිරීම

අයදුම් පත්‍රය ලබාගැනීම සඳහා මුද්දර ඇලවූ ලිපි කවරයක් සමග රු. 400.00 ක තැපැල් ඇණවුමක් සී/ස උඩිස්පත්තුව විවිධ සේවා සමුපකාර සමිතිය නමින් එවීමෙන් හෝ ප්‍රධාන කාර්යාලයට පැමිණ ලබාගත හැකිය.

සියලුම අධ්‍යාපන සහතිකවල පිටපත්, පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය සමග උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද සමග පහත සඳහන් ලිපිනයට 2024.02.07 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. දැනට සේවයේ නියුතු අය තම ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතුය.

දී ඇති උපදෙස්වලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් එවීමේ දී අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **සාමාන්‍යාධිකාරී තනතුර** යන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**

**ගරු සභාපති,**
**සී/ස උඩිස්පත්තුව විවිධ සේවා සමුපකාර සමිතිය, උඩිස්පත්තුව.**
**දු. ක. 081 - 2053740**

**මෙයට,**
**වැ/ බ සාමාන්‍යාධිකාරී**